පුනරීක්ෂණ අභ්‍යාසය 2

(1) (i) අගය සොයන්න 6.785×1000.

(ii) සුළු කරන්න $3\frac{1}{3} - 1\frac{1}{4}$.

(iii) $a = 4$ වන විට, $2a + 5$ හි අගය සොයන්න.

(iv) 5.075 g, ග්‍රෑම් සහ මිලිග්‍රෑම්වලින් ලියන්න.

(v) විසඳන්න $2x + 5 = 7$.

(vi) 96 cm 6 mm ÷ 7 සුළු කරන්න.

(vii) මෙම ආස්තරයේ වර්ගඵලය සොයන්න.



(viii) පැත්තක දිග 5 cmක් වූ ඝනකයක පරිමාව සොයන්න.

(ix) $1\frac{5}{7}$ විෂම භාගයක් ලෙස ලියන්න.

(x) $\frac{17}{5}$ මිශ්‍ර සංඛ්‍යාවක් ලෙස ලියන්න.

(xi) රූපයේ අඳුරු කළ කොටසේ වර්ගඵලය සොයන්න.



(xii) සමචතුරස්‍රාකාර ඉඩමක පරිමිතිය 22 mක් නම්, ඉඩමෙහි පැත්තක දිග සොයන්න.

(xiii) සෘජුකෝණාස්‍රාකාර ඉඩමක වර්ගඵලය 24 m^2ක් ද දිග 8 mක් ද නම්, එම ඉඩමෙහි පළල සොයන්න.

(2) (a) < හෝ > හෝ යන සංකේත සුදුසු පරිදි යොදා හිස්තැන් සම්පූර්ණ කරන්න.

(i) $\frac{3}{4}$ ..... $\frac{1}{4}$ (ii) $\frac{1}{4}$ ..... $\frac{5}{12}$ (iii) $3\frac{5}{8}$ ..... $3\frac{1}{3}$

(b) සුළු කරන්න.

(i) $3\frac{5}{12} + \frac{7}{12}$ (ii) $2\frac{2}{7} + \frac{9}{14}$ (iii) $2\frac{5}{8} - 1\frac{1}{8}$ (iv) $3\frac{7}{8} - 2\frac{2}{3}$

(c) දිලීප හා සිතුමිණ බහුවරණ ප්‍රශ්න පත්‍රයකට පිළිතුරු ලිවුවෝය. එයින් දිලීපගේ නිවැරදි පිළිතුරු සංඛ්‍යාව $\frac{5}{8}$ ක් ද සිතුමිණගේ නිවැරදි පිළිතුරු සංඛ්‍යාව $\frac{3}{4}$ක් ද විය. වැඩි ප්‍රශ්න සංඛ්‍යාවකට නිවැරදි ව පිළිතුරු සපයා ඇත්තේ දිලීප ද සිතුමිණ ද හේතු දක්වමින් පෙන්වා දෙන්න.

(d) ප්‍රශ්න පත්‍රයකට ලබා දෙන මුළු ලකුණු ප්‍රමාණයෙන් 0.36ක් රහුමාන් ලබාගත් අතර $\frac{9}{25}$ක් රහුල්දෙව් ලබා ගත්තේ ය. රහුල්දෙව් ලබා ගත් ලකුණු ප්‍රමාණය ම රහුමාන් ද ලබා ගෙන ඇති බව පෙන්වන්න.

(3) (a) පහත දැක්වෙන භාග සහ මිශ්‍ර සංඛ්‍යා දශම සංඛ්‍යා ලෙස ලියන්න.

(i) $\frac{648}{1000}$ (ii) $\frac{6}{20}$ (iii) $\frac{7}{8}$ (iv) $2\frac{1}{4}$

(b) සුළු කරන්න.

(i) 0.875×100 (ii) 3.25×6 (iii) 0.005×22

(iv) $127.5 \div 10$ (v) 24.68×8 (vi) $13.75 \div 1000$

නොමිලේ බෙදා හැරීම සඳහා ය.

(4) ගෙවත්තක රූපයක් මෙහි දැක්වේ.

(i) මෙම ගෙවත්තේ පරිමිතිය සොයන්න.

(ii) මල් වගා කර ඇති ප්‍රදේශවල වර්ගඵලය සොයන්න.

(iii) ගෙවත්තේ වර්ගඵලය සොයන්න.



(5) (i) පහත දැක්වෙන එක් එක් ත්‍රිකෝණය සමපාද ත්‍රිකෝණයක් ද, සමද්විපාද ත්‍රිකෝණයක් ද, විෂම ත්‍රිකෝණයක් ද යන්න සඳහන් කරන්න.



(ii) පහත දැක්වෙන එක් එක් ත්‍රිකෝණය සුළු කෝණී ත්‍රිකෝණයක් ද ඍජු කෝණී ත්‍රිකෝණයක් ද මහා කෝණී ත්‍රිකෝණයක් ද යන්න සඳහන් කරන්න.



(6) රූපයේ දැක්වෙන ගේට්ටුවේ සිරස් කණු 4ක් ඇත. එක් එක් කණුවේ උස 1.75 m බැගින් වේ.



(i) ඒ සඳහා යකඩ පයිප්පයක් යොදා ගන්නේ නම්, මිල දී ගත යුතු යකඩ පයිප්පයේ මුළු දිග කීය ද?

(ii) එහි හරස් අතට යොදා ඇති යකඩ පටි 6 කපා ගැනීම සඳහා යොදා ගත් යකඩ සාම්පලයේ මුළු දිග 8.4 m නම්, හරස් අතට යෙදූ එක් යකඩ පටියක දිග සොයන්න.

(7) (a) (i) පරාවර්ත කෝණ 1ක් ඇති සහ පාද 6ක් ඇති අවතල බහු අස්‍රයක් අඳින්න.

(ii) මෙහි දැක්වෙන බහු අස්‍රවලින් සවිධි බහු අස්‍ර තෝරා ලියන්න.



(8) (a) (i) රූපයේ දැක්වෙන ඝනකයේ පරිමාව සොයන්න.

(ii) එහි සෑම දාරයකම දිග දෙගුණ කළ විට සෑදෙන ඝනකයේ පරිමාව ගණනය කරන්න.



(b) රූපයේ දැක්වෙන්නේ ඝනකාභයකි.

(i) මෙම ඝනකාභයේ පරිමාව සොයන්න.

(ii) එහි දිග සහ පළල වෙනස් නොකොට උස පමණක් වෙනස් කිරීමෙන් පරිමාව 96 cm^3ක් වන ඝනකාභයක් සකස් කිරීමට නම් එම උස කීයක් විය යුතු ද?



(9) O කේන්ද්‍රය වූ වෘත්තයක් රූපයේ දැක්වේ. AC සරල රේඛාවකි.

(i) AC හඳුන්වන විශේෂ නම කුමක් ද?

(ii) OB මගින් දැක්වෙන දුර හඳුන්වන විශේෂ නම කුමක් ද?

(iii) මෙහි ඇති සමද්විපාද ත්‍රිකෝණ දෙකක් නම් කරන්න.

(iv) $AB = 6$ cm ද $BC = 8$ cm ද වෘත්තයේ අරය 5 cm ද වේ. OBC, AOB සහ ACB ත්‍රිකෝණවල පරිමිතිය වෙන වෙනම සොයන්න.



(10) නිවාස තුනක් සතියක් තුළ කිරි වෙළෙන්දෙකුගෙන් ලබා ගන්නා කිරි ප්‍රමාණ පිළිබඳ ව දත්ත කිහිපයක් පහත දැක්වේ.

(i) A නිවස දිනකට කිරි 1 l 500 ml බැගින් දින හතම කිරි ලබාගනී. A නිවස සතියේ දින 7 තුළ ලබා ගන්නා මුළු කිරි ප්‍රමාණය සොයන්න.

(ii) B නිවස දින හත තුළ ලබාගන්නා මුළු කිරි ප්‍රමාණය 12 l 250 ml වන අතර සෑම දිනක ම සමාන කිරි ප්‍රමාණයක් ලබා ගනී. B නිවස එක් දිනක දී ලබා ගන්නා කිරි ප්‍රමාණය සොයන්න.

(iii) C නිවස සතියේ දින පහේ කිරි 7 l 500 ml ලබා ගන්නා අතර සෙනසුරාදා සහ ඉරිදා දිනයන්හි 2 l 750 ml ලබාගනී. C නිවස සතිය තුළ ලබා ගන්නා කිරි ප්‍රමාණය සොයන්න.

(iv) C නිවස පාසල් නිවාඩු කාලයේ දී මෙතෙක් සතිකට ලබාගත් කිරි ප්‍රමාණයට 250 ml එකතු කොට දින 7ම සමාන ප්‍රමාණයෙන් කිරි ලබාදෙන ලෙස වෙළෙන්දාගෙන් ඉල්ලීමක් කරන ලදි. ඒ අනුව නිවාඩු කාලයේ දී එක් දිනකට වෙළෙන්දා කිරි කොපමණ ප්‍රමාණයක් C නිවසට ලබා දිය යුතු ද?

(11) බිස්කට් වර්ගයක් ඇසුරුම් වශයෙන් වෙළෙඳපොළට නිකුත් කෙරේ.

(i) බිස්කට් එකක ස්කන්ධය 8 g 250 mg වේ. එක් ඇසුරුමක බිස්කට් 25ක් අඩංගු කරයි නම්, ඇසුරුමක ඇති බිස්කට්වල ස්කන්ධය සොයන්න.

(ii) එම බිස්කට් ඇසුරුමෙහි ස්කන්ධය 760 mgකි. ඇසුරුම සමග බිස්කට්වල මුළු ස්කන්ධය සොයන්න.

(iii) එවැනි බිස්කට් ඇසුරුම් 12ක්, ස්කන්ධය 40 g වූ පෙට්ටියක අසුරා තොග වෙළෙඳුන්ට නිකුත් කරනු ලැබේ. තොග වෙළෙන්දෙක් මෙවැනි පෙට්ටියක් රැගෙන ගියේ නම් ඔහු රැගෙන ගිය ද්‍රව්‍යවල මුළු ස්කන්ධය සොයන්න.

(12) (a) (i) $9x + 7 = 97$ විසඳන්න.

(ii) පොත් 8ක් මිල දී ගෙන රුපියල් 200ක් දුන් විට නිමල්ට රුපියල් 40ක් ඉතිරි මුදල් ලෙස ලැබිණි. පොතක මිල රුපියල් x ලෙස ගෙන මෙම දත්ත දැක්වීමට සමීකරණයක් ගොඩ නගන්න. පොතක මිල සොයන්න.

(b) සමාන ප්‍රමාණයේ ඉරටු කැබලිවලින් සකස් කළ සරල රේඛීය තල රූප දෙකක සැකිලි මෙහි දැක්වේ. එක් ඉරටු කැබැල්ලක දිග සෙන්ටිමීටර a වේ.

(i) පළමු රූපයේ පරිමිතිය a ඇසුරෙන් ලියන්න.

(ii) දෙවන රූපයේ පරිමිතිය a ඇසුරෙන් ලියන්න.

(iii) රූප දෙක නිර්මාණයට යොදාගත් ඉරටු කැබලිවල මුළු දිග 42 cm නම් a ඇසුරෙන් සමීකරණයක් ගොඩ නගන්න. එය විසඳීමෙන් aහි අගය ලබා ගන්න.



(i)



(ii)

(13) පොතක් මුද්‍රණයේ දී එක් පොතක පිට කවරය සඳහා රුපියල් y ද එක් පිටුවක් සඳහා රුපියල් p ද බැගින් වැය වේ. ඒ අනුව,

(i) පිටු 45ක් සහිත පොතක එක් මුද්‍රිත පිටපතක් සඳහා වැය වන මුදල රුපියල් c නම්, c සඳහා p හා y ඇතුළත් සූත්‍රයක් ගොඩ නගන්න.

(ii) එම පොත මුද්‍රණයට වැය වන මුදල රුපියල් 115 නම් ද පිටකවරය සඳහා වියදම රුපියල් 25ක් නම් ද එක පිටුවක මුද්‍රණ වියදම වන pහි අගය රුපියල් කීය ද?

(14) ක්‍රීඩකයන් දෙදෙනකු තම පුහුණුව සඳහා සතියට දින 2ක් යොදා ගනී. සතියක ධාවනය කළ දුරවල් පහත දැක්වේ.

දිනය	ශනුක	කවිඳු
සඳුදා	2 km 800 m	1 km 200 m
අඟහරුවාදා	4 km 400 m	3 km 800 m

(i) දින දෙක තුළ වැඩි දුරක් පුහුණුවීම්වල යෙදී ඇත්තේ ශනුක ද කවිඳු ද?

(ii) ශනුක සඳුදා දිනයට වඩා අඟහරුවාදා දින වැඩිපුර කොපමණ දුරක් ධාවනය කර තිබේ ද?

(iii) අඟහරුවාදා දිනයේ ශනුක, කවිඳුට වඩා කොපමණ දුරක් වැඩිපුර පුහුණුවීම්වල යෙදී තිබේ ද?

(iv) ශනුක සති 4ක් තුළ මේ ආකාරයට ම පුහුණුවීම්වල යෙදුණේ නම් ඔහු පුහුණුවීම්වල යෙදුණු මුළු දුර සොයන්න.